රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 01/2014 (II)

මගේ අංකය :- EST-2/POLCY/03/0798-I
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2016.01.14

අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි 02 ඡේදය සහ 2014.09.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014(I) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම විධිවිධාන අනුව අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා මට්ටම අත්කර ගැනීමට ලබා දී ඇති සහන කාලය තුළ අදාළ නිලධරයන්ට ඉහත චක්‍රලේඛ මඟින් හඳුන්වා දුන් නව විධිවිධානයන්ට අදාළ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීමට ප්‍රමාණවත් අවස්ථාවක් නොලැබුණු හෙයින් 2012.06.30 දින දක්වා රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගත් සියලුම නිලධරයන්ට 2018.12.31 දක්වා සහන කාලයක් ලබාදීමට 2015.12.16 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත. එකී සහන කාලය පිළිබඳව අදාළ නිලධරයන් දැනුම්වත් කරන මෙන් මෙයින් දන්වා සිටිමි.

ජේ. දඩල්ලගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය